මගේ අංකය
எமது இல
My No.
VV/4/GC/33(ii) 34 (i)

ඔබේ අංකය
Your No.
உமது இல

දුරකථනය
தொலைபேசி
Telephone
2881000
2853777

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கைத் திறந்த பல்கலைக்கழகம்
THE OPEN UNIVERSITY OF SRI LANKA

තැපැල් පෙට්ටිය 21
නාවල
නුගේගොඩ

அஞ்சற் பெட்டி 21
நாவல
நுகேகொட

Post Office Box 21
Nawala
Nugegoda

2021 ඔක්තෝබර් 04 දින

හිතවත් උපාධිලාභීන් වෙත,

## උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් **2021 නොවැම්බර් මස 02** වන දින පැවැත්වීමට නියමිත සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිලාභියෙකු ලෙස උපාධිය පිරිනැමීම සඳහා ඔබ සුදුසුකම් ලබා ඇති බව සතුටින් දැනුම් දෙමි.

දැනට රට තුළ පවතින කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුකොට ගෙන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය **33 වන උපාධි ප්‍රදානෝත්සවයේ දෙවන කොටස** සහ **34 වන උපාධි ප්‍රදානෝත්සවයේ පළමු කොටස** අදියර දෙකක් යටතේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

I පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලාවන් පිරිනැමීම සඳහා උපාධි ප්‍රදානෝත්සවය **2021 නොවැම්බර් මස 02** වන දින කුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතය. මෙහිදී දර්ශනපති සහ දර්ශන ශූරී උපාධිලාභීන් සඳහා පමණක් අභිමුඛයේ උපාධි ප්‍රදානය සිදු කරනු ලබයි.

II ඉහත උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි පිරිනමන ලද උපාධිලාභීන් සඳහා විධිමත් උපාධි ප්‍රදානෝත්සවයක් දැනට රට තුළ පවත්නා තත්ත්වය යහපත් වූ වහාම පැවැත්වීමට කටයුතු කරන අතර ඒ පිළිබඳ තොරතුරු පසුව දැනුම් දෙනු ලැබේ.

පහත සඳහන් පරිදි උපාධි ප්‍රදානෝත්සව ගාස්තු ඔබ විසින් ගෙවිය යුතු වේ. මේ සඳහා අදාළ මුදල් ගෙවීමේ වවුචරය පහත අන්තර්ජාල සබැඳිය (link) හරහා ලබා ගත හැකිය.

| | |
|---|---|
| උපාධි පාඨමාලාවන් සඳහා | රු. 2,200.00 |
| පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | රු. 3,500.00 |

https://reginfo.ou.ac.lk/

කරුණාකර පහත දැක්වෙන අන්තර්ජාල (Google form) සබැඳිය (link) හරහා උපාධි ප්‍රදානෝත්සවය සඳහා වන ඉල්ලුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.

https://forms.gle/r63psxGcRRCegb2p7

සම්පූර්ණ කරන ලද උපාධි ප්‍රදානෝත්සව ඉල්ලුම්පත හා මුදල් ගෙවීමෙන් පසු ලැබෙන ගෙවීම් රිසිට්පත **2021.10.17 වන දින ප.ව 4.00 ට පෙර** ඉදිරිපත් කළ යුතුවේ.

සියලුම ගෙවීම්, මහජන බැංකුවේ නුගේගොඩ ශාඛාවේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ **අංක 0174100151189657 දරන ගිණුමට** බැර කළ යුතු වේ. ගෙවීම් වවුචරයේ විශ්වවිද්‍යාල පිටපත (දෙවන පිටපත) හෝ online බැර කිරීමේ රිසිට් පත නිවැරදිව සම්පූර්ණ කරන ලද ගූගල් අයදුම්පත (Google Form) සමග අමුණා තිබීම අත්‍යවශ්‍ය වේ.

***සැ.යු. ස්වයංක්‍රිය මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර හරහා මුදල් ගෙවීම සිදුකල නොහැකි බව කාරුණිකව සලකන්න.***

ඔබ මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී නොවුව ද අදාළ උපාධිය සඳහා ඔබ ඉල්ලුම් කළ යුතුය. ඒ සඳහා ඔබ විසින් **රු. 2,200.00 ක් වන උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව සහ විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු හිඟ මුදල් තිබේ නම්, ගෙවා 2021.10.17 වන දින ප.ව 4.00 ට පෙර විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කළයුතු වේ**. එසේ කිරීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබගේ උපාධි සහතිකය නිකුත් කරනු නොලැබේ.

ඉහත ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් හෝ චෙක්පත් බාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

තවද, රට තුළ පවතින වසංගත රෝග තත්ත්වය සැලකිල්ලට ගෙන, “කුරියර්” සේවාවක් හරහා සිසුන්ගේ මුල් උපාධි සහතිකය උපාධිලාභීන් වෙත ලබා දීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තීරණය කර තිබේ. එබැවින් කුරියර් සේවාව තුළින් ඔබගේ උපාධි සහතිකය ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, කරුණාකර ගූගල් පෝරමය (Google Form) මගින් ඔබේ කැමැත්ත ලබා දෙන්න.

අදාළ සහතිකය ඔබ වෙත ලැබුණු පසු **රු. 300.00 ක** බෙදා හැරීමේ ගාස්තුවක් ඔබ විසින් “කුරියර්” සේවා සපයන ආයතනය වෙත ගෙවිය යුතු අතර, සහතිකය භාරගත් බවට ඒ අවස්ථාවේ දී සටහන් කළ යුතු වේ.

ස්තුතියි.



වැඩ බලන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ විභාග

ලේඛකාධිකාරී වෙනුවට

සටහන -

01. ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත යම් හිඟ ගාස්තු ගෙවීමට තිබේ නම් සහතිකය නිකුත් කරනු නොලැබේ. එබැවින් 2021.10.17 වන දිනට පෙර හිඟ මුදල් තිබේ නම් එය විශ්වවිද්‍යාලය වෙත ගෙවීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් දන්වමි.

02. අදාළ අයදුම් පතේ ඔබගේ නම සඳහන් කිරීමේදී ඔබ විශ්වවිද්‍යාලයේ හදාරන ලද අධ්‍යයන පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී යෙදූ ආකාරයට ම සඳහන් කළ යුතුය.

03. පාඨමාලාවට ඇතුළත් වීමේ දී ඔබ ලබාදුන් නමට වඩා මෙම පෝරමයේ සඳහන් කරනු ලබන නම වෙනස් වන්නේ නම් ඒ සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

04. ඔබ විසින් සපයන ලද තොරතුරුවල දෝෂ හේතුවෙන් සහතිකයේ නම වැරදි ලෙස සඳහන්ව ඇත්නම් එය නිවැරදි කිරීම සඳහා අමතර ගාස්තුවක් වශයෙන් **රු. 1000.00** ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු වේ.

05. තවද, ඔබ විශ්වවිද්‍යාලයීය පුස්තකාලයෙන් පොත්පත් ලබාගෙන ඇත්නම් ඒවාද මෙදිනට පෙර ආපසු භාරදිය යුතුය.